7 පිටෙන්

එනිසාම දිනපතා උදෙන්ම යාමටත් බොහෝ රෑ බෝ වී නිවසට ඒමටත් මට සිදුවිය. අතපසු වූ වැඩ අල්ලා ගන්නටත් පැවරුම් කලට වේලාවට අවසන් කරන්නටත් මම මගේ කාලය සම්පූර්ණයෙන් ම වැය කළෙමි.

අශේන් සිය පුනරුත්ථාපන වැඩ සටහන නිසි ලෙස අනුගමනය කරන්නේ  යයි මම සිතා සිටියෙමි. ඔහුගේ හැසිරීම හා පෙනුම බොහෝ සෙයින් වෙනස් වන බවක් මම නිරීක්ෂණය කළෙමි. වෙනදා නැති ප්‍රබෝධමත් හැසිරීමක් හා පෙනුමක් ඔහු වෙතින් දිස් විය. ඒ පිළිබඳව මම මහත් සේ සතුටු වුණෙමි.

උදෑසන පිටව යන්නට පෙර හැකි සෑම විටම ඔහු කැමති දෙයක් පිස තබා යන්නට මම වෙහෙසුනෙමි. කොපමණ රෑ බෝ වී පැමිණියද නිවස පිරිසිදු කර අස්පස් කර තබන්නටද මම උත්සාහ ගත්තෙමි. තමා අවට පරිසරයේ ප්‍රිය ජනක බව පුනරුත්ථාපනය වන මත් ද්‍රව්‍ය ලෝලියෙකුට බොහෝ සෙයින් වැදගත් බව මම දැන සිටියෙමි. මේ නිවස හැකිතරම් දුරට ප්‍රිය මනාප තැනක් බවට පත් කරන්නට මම උත්සාහ ගත්තෙමි.

අවසාන විභාගය මා සිතූ තරම් අපහසු එකක් නොවී ය. මා නිසි ලෙස සූදානම්ව සිටීම එයට හේතුව වන්නට ඇත. අවසාන දිනයේ විභාග ශාලාවෙන් පිටතට පැමිණෙන විට මගේ සිත මහත් වූ ශෝකයකින් පිරී පැවතුණි. වසර ගණනාවක් ජීවිතය ගත කළ සරසවි බිම පාලුවට ගොස් තිබුණි. ආපන ශාලාවේ හිස් මේසයක් ඉදිරියේ වාඩි වී මම හාත් පස සිසාරා බැළුවෙමි.

දේශණ ශාලා, පරිගණක විද්‍යාගාර තුළ නැවත වතාවක් ඇවිද යන්නට මට සිතෙයි. යහළු යෙහෙළියන් සමගින් කෙලි කවට බස් දොඩමින් නැවත ඇවිද යන්නට ඇත්නම් කොයි තරම් අපූරුද?

පුස්තකාලය ඉදිරියේ වූ බංකුවක් මත වාඩි වී සිටි පෙම් යුවළක් මොනවාදෝ මුමුණමින් සිටිනු මට මෙතැනට පෙනෙයි. කලකට පෙර අශේන් ද මේ සරසවි බිමේ මගේ ආදරය යදිමින් මා පසු පස ආ හැටි මට සිහිපත් වෙයි. එය සොඳුරු සිහිනයක් මෙනි. ඒ සුන්දරත්වය මා ඇස් ඉදිරියේම වැනසී ගිය ආකාරය අදහාගත නොහැකි තරම් ය. සිහිනයකින් පිබිදුන පසු අද මම යතාර්ථයට මුහුණ දෙමින් සිටින්නේමි. කොයි තරම් කටුක වුවද ජීවිතය යනු මේ අද මම මුහුණ දෙමින් සිටින සත්‍යයයි. එයින් ගැලවී යා හැකි මගක් මට කොයින්ද?

අම්මාගේ මරණයෙන් මාසයක් ගතවුණ දිනයේදී මම තනිවම පන්සලට ගොස් ඇයට පින් දුන්නෙමි. සුනෙත් අයියාට කතා කරන්නට තරම් ධෛර්යයක් මට නොවී ය. මා තනිවම යන්නට තීරණය කළේ එනිසා ය.

බොහෝ ඈත අතීතයක අම්මාගේ අතේ එල්ලී ගමේ පන්සලේ වැලි තලාව මතුයේ පිය නැගූ මම අද තනිවම අප හැර ගිය ඇයට පින් දෙමින් සිටින්නෙමි.  ජීවිතය තේරුමක් නැති හිස් එකකැයි මට සිතෙයි. මෙය ගැලවීමක් නැති උගුලක් පමණක් නොවේදැයි මට සිතෙයි. දරා ගත නොහැකි මහා පාළුවකින් මගේ සිත පිරී ඇත.

මම බොහෝ වේලාවක් බුදුන් වැන්දෙමි. කලකට පසු හිත නිවී සැනසෙන තෙක් බුදු මැදුරේ බුදු රුව ඉදිරියේ දණ ගසාගෙන සිටියෙමි.

මා නිවසට එන විට සවස පහට පමණ වන්නට ඇත. ඉදිරි දොර වසා තිබුණ බැවින් මම මා අත වූ යතුරෙන් දොර ඇරගෙන ගෙතුළට ගියෙමි. නැහැය කඩා ගෙන යන සිගරට් ගඳකින් නිවස පිරී පැවතුණි.  ටීපෝව මත වූ අලු බඳුනේ අඩක් දැවී ගිය සිගරට් කොට කීපයක් වූ අතර ඒ අසළම බිම හිස් බීර බෝතල කීපයක් විය.

**මා නිවසට එන විට සවස පහට පමණ වන්නට ඇත. ඉදිරි දොර වසා තිබුණ බැවින් මම මා අත වූ යතුරෙන් දොර ඇරගෙන ගෙතුළට ගියෙමි. නැහැය කඩා ගෙන යන සිගරට් ගඳකින් නිවස පිරී පැවතුණි.  ටීපෝව මත වූ අලු බඳුනේ අඩක් දැවී ගිය සිගරට් කොට කීපයක් වූ අතර ඒ අසළම බිම හිස් බීර බෝතල කීපයක් විය.**



මහත් බියකින් මගේ සිත පිරී යයි. පසුගිය කාලය පුරාම අශේන් සිය යහළුවන්ගෙන් ඈත්ව සිටියේ ය.

"මාව මේ නරක පාරට ගෙනිච්චෙ මුන් තමයි.." අශේන් වරින් වර කී හැටි මට මතකය. නැවතත් මේ නිවසට යක්ෂ බැල්ම වැටුණි ද?

සිත බොහෝ සෙයින් චංචලව ඇත. මම සෝපාව මත වැටී බොහෝ වේලාවක් කල්පනා කරමින් සිටියෙමි. තාත්තාට කතා කළ යුතු යයි ඒ මොහොතේ මට සිතුනේ ඇයි ද යන පැනයට අදටත් මට පිළිතුරක් නොමැත. මම තාත්තාගේ දුරකථන අංකය එබුවෙමි.
අනෙක් කෙළවරින් දුරකථනය නාද වෙනු මට ඇසුණි. දෙතුන් වතාවක් නාද වීමෙන් පසු කිසිවකු රිසිවරය ඔසවනු මට ඇසුණි.

"මම කෞෂල්‍යා..." මම කීවෙමි.

"දෙයියනේ පුංචි මැණිකේ..." ගුණපාල මාමා ගේ කටහඬ රිසිවරය තුළින් ඇසුණි "
".. අපි ඔයාට කෝල් එකක් ගන්න ඊයෙ ඉඳන් දඟලනවා... දෙයියනේ ඇති යන්තම් මැණිකෙ කතා කළා..."
"ඇයි... ඇයි මාව හොයන්නෙ..?" මම වහා ඇසුවෙමි.

"පුංචි මැණිකේ.. කලබල වෙන්න එපා... "

"කියන්න.. කියන්න.."  මම නොයිවසිලිමත් වීමි.
"පෙරේදා අපේ .... අපේ මහත්තයා..."

ගුණපාල මාමා ගොත ගසයි..

"දෙයියනේ තාත්තට මොකද..?"

"මහත්තයට... මහත්තයට වෙඩි වැදුණා... වෙඩි වැදුණා නෙවෙයි මැණිකේ උන් වෙඩි තිබ්බා..."
හිස මතට තුලුගෙඩි පහරක් වැදුනාක් මෙන් මට දැනෙයි. ".. තා... තාත්තට.. කො ... හො.. ම.. ද..?" මම අපහසුවෙන් ඇසුවෙමි. මට දැනගන්නට අවශ්‍ය වූයේ එපමණකි.

"මහත්තයා දැඩි සත්කාර ඒකකයේ... අනේ මැණිකේ මොකද මේ වුණේ..?" ගුණපාල මාමා හඬන හඬ මට ඇසෙයි. ".. අපේ මහත්තයට තාම සිහිය නෑ මැණිකේ... උන් අපේ මහත්තයට වෙඩි තිබ්බා ... වෙඩි තිබ්බා... අපේපේ මෙහෙමත් අපරාදයක්.."

"කව්ද වෙඩි තිබ්බෙ..?"
"ගුරුසිංහයගෙ මිනිස්සු... පාහර බල්ලෝ..." ගුණපාල මාමා තව මොන මොන වාදෝ කියවයි.. මම රිසිවරය තැබුවෙමි.
කුමක් කළ යුතුදැයි සිතා ගන්නට මට වොහැකි ය. මම සෝපාව මත ගුලි ගැසී හැඬුවෙමි. කොපමණ වේලාවක් හැඬුවාදැයි මම ම නොදත්තෙමි. සිහි එළවාගත හැකි වූ පළමු තත්පරයේ දි මම නැවත දුරකථනය අතට ගත්තෙමි. මගේ පසුම්බිය අවුස්සා ගුවන් ටිකට් නිකුත් කරන ආයතනයක අංකය  සොයා ගත්තෙමි.

"මට ඉක්මනට ලංකාවට යන්න ඕනෙ.. ඉක්මනට.. අදම... කීයක් ගියත් කමක් නැහැ.. ඉක්මනට ටිකට් එකක් බුක් කරන්න.." මම සිංහලෙන්ම කීවෙමි.

"අදම යන්න නම් බැරි වෙයි මිස්.." අනෙක් කෙළවරේ සිට කතා කළ පුද්ගලයා කීවේ ය.
".. මට ගන්න පුළුවන් ළඟම ටිකට් එක තියෙන්නෙ හෙට..."
"කමක් නැහැ.. බුක් කරන්න.. මම දැන්ම ඉන්ටනෙට් එකෙන් සල්ලි ට්‍රාන්ස්ෆර් කරන්නම්.."
රිසිවරය තැබූ වහාම මම පරිගණකය ක්‍රියාත්මක කළෙමි. අවශ්‍ය මුදල් ප්‍රමාණය මගේ බැංකු ගිණුමෙන් යැව්වෙමි.

හෙට වනතුරු කල් මරන්නේ කෙසේ දැයි මට සිතා ගත නොහැකි ය. මම ඇඳුම් බෑගයට අතට අසුවන අසුවන ඇඳුම් එබුවෙමි. ගෙන යා යුත්තේ මොනවාද කියා හෝ සිතන්නට තරම් නිරවුල් මනසක් මට නොවී ය.
මෙල්බන් නගරය ඉහත්තාවේ සිට අන්ධකාරය ගලා එමින් තිබුණි. ගෙතුළ විදුලි පහන් දල්වන්ට හෝ මට නිනව්වක් නොවී ය. මම සෝපාව මත ගුලි වී පිස-සියක සේ බලාගත් අත බලාගෙන සිටියෙමි.

රෑ දොළහේ කණිසම නාද වනු පවා මට හොඳින් ඇසුණි. ඉන් පැය බාගයකට පමණ පසු කිසිවකු ගෙයි ඉදිරි දොර අරින්නට තැත් කරනු ද මට ඇසුණි. මම කාමරයට ගොස් දොර වසා ගත්තෙමි. කිසිවකු නිවස තුළට ඇතුල් වනු මට දැනුණි.

